" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

108

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.05.26 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්,

ආණ්ඩුකාරවර කාර්යාලය,

බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මුල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගැනීම සුදුසු වන බව 2022.05.26 දින රැස්වූ චක්‍රලේඛ පළාතට අදාල කර ගැනීමේ කමිටුව විසින් නිර්දේශ කර ඇත.

02. එම නිර්දේශය මවිසින්ද නිර්දේශ කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2022.05.25<br>රා.ප.චක්‍රලේඛ 10/2022 | පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම. |

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන).

අත් කළේ :- ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

c/c
05/26

106

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.05.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම</u>**

ඉන්ධන සපයා ගැනීම සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු හේතුවෙන් පොදු සහ පෞද්ගලික ප්‍රවාහන සේවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා රජයේ නිලධරයන්ට සේවය සඳහා වාර්තා කිරීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුව ඇති බවට වන නියෝජනයන් විවිධ පාර්ශව වෙතින් ඉදිරිපත්ව ඇත. තව ද මෙම දුෂ්කර කාලසීමාව තුළ ඉන්ධන, විදුලිය සහ ජලය සඳහා වන රජයේ වියදම් ද සීමා කළ යුතුව ඇත.

02. ඉහත සඳහන් කරුණු පිළිබඳ 2022.05.23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අවධානය යොමු වී ඇති අකර, රජයේ කාර්යාලවලින් පොදු මහජනතාවට ඉටු වන කාර්යයන්ට බාධාවක් නොවන පරිදි රජයේ නිලධරයන් සේවයට කැඳවීම සීමා කිරීමට තීරණය කර ඇත. ඒ අනුව නැවත උපදෙස් ලබා දෙන තෙක් ඔබ යටතේ පවත්නා ආයතන මඟින් සපයනු ලබන මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය අවම නිලධරයන් පමණක් 2022.05.26 දින සිට සේවයට කැඳවීම සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙළක් ඔබ විසින් සකසා ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වමි.

03. මෙහි දී රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2022.03.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 කෙරෙහි ද අවධානය යොමු කර කටයුතු කරන මෙන් වැඩිදුරටත් අවධාරණය කරමි.

04. තව ද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය